**කොළඹ විශ්ව විද්‍යාලය - ශ්‍රී ලංකාව**

**ශාස්ත්‍ර පීඨය**

**ශාස්ත්‍රවේදී තෙවන වසර පරීක්ෂණය - දෙවන සෙමෙස්තරය -2016/2017**

**PSC -3252 - රාජ්‍ය ප්‍රතිපත්ති සහ පරිපාලනය : තුලනාත්මක දැක්මක්**

**කාලය : පැ දෙකයි (02)**

ප්‍රශ්න **තුනකට (03)** පමණක් පිළිතුරු සපයන්න.

එක් පිළිතුරකට ලැබෙන උපරිම ලකුණු ප්‍රමාණය **විස්සකි (20)**

---

1. "ගෝලීය සම්බන්ධතා දැනුම ව්‍යාප්ත කර ඇතිසේම සාමාන්‍ය ජීවන තත්ත්වය ඉහළ නංවා ඇත. නමුත් ගෝලීයවාදයේ වර්තමාන රූපාකාරය ලෝකයේ දුගී ම කොටසට අයුතු හානි පමුණුවයි." - අමර්ත්‍යා සෙන් ඉහත ප්‍රකාශය සමඟ ඔබ එකඟ වන්නේ ද? උදාහරණ සහිත ව පැහැදිලි කරන්න.

2. අව ම වශයෙන් එකිනෙකට වෙනස් රාජ්‍ය පරිපාලන සුසමාදර්ශ දෙකක්වත් අදාළ කොටගෙන 1945න් පසු රාජ්‍ය පරිපාලනයේ සුසමාදර්ශය විතැන් වීම පැහැදිලි කරන්න.

3. නව ලිබරල් රාජ්‍යයක සේවා සැපයීම අසාර්ථක වීමට බලපාන සාධක විභාග කරන්න.

4. සේවා සැපයීම පෞද්ගලීකරණය වීමෙන් සමාජය මත ඇති වන බලපෑම තෝරාගත් ඕනෑ ම රටකට අදාළ ව සාකච්ඡා කරන්න.

5. නිදහසින් පසු ශ්‍රී ලංකාවේ ජනවාර්ගික අර්බුදය උත්සන්න කිරීමෙහිලා රාජ්‍ය ප්‍රතිපත්තිවල භූමිකාව විවේචනාත්මකව විශ්ලේෂණය කරන්න.

( අ.පි.බ.)

6. පහත සඳහන් ඕනෑ ම මාතෘකා **<u>දෙකක් (02)</u>** පිළිබඳ සටහන් ලියන්න.

i. ගෝලීයකරණය යටතේ සංවර්ධනය වෙමින් පවතින රටවල කාලීන ගැටලු

ii. සාර්ව-ආර්ථික ප්‍රතිව්‍යුහගතකරණ සහ ලෝක බැංකුව

iii. සංවර්ධන පරිපාලනය

iv. නිදහසින් පසු ශ්‍රී ලංකාවේ රාජ්‍ය පරිපාලනය දේශපාලනීකරණය වීම

**********************